## කොළඹ විශ්වවිද්‍යාලය
## ශ්‍රී ලංකාව
## පුරප්පාඩු (කොන්ත්‍රාත් පදනම මත)

කොළඹ විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා යෝග්‍ය සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ජලනල කාර්මික (කොන්ත්‍රාත් පදනම මත) (Plumber -On Contract)**

1. අටවන ශ්‍රේණිය සමත් විය යුතුය
2. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණත්වයක් ලබා තිබිය යුතුය.
   - අඟලෙන් 1/64 දක්වා පරිමාණයෙන් කියවීමට හැකිවීම හා ආයුධ නඩත්තු කිරීම හා ඒවායේ වත්මන් භාවිතය
   - නොයෙකුත් පිරිද්දුම් ඇතුළත්ව සී.අයි. ජී.අයි. ඊයම් පයිප්ප දැමීම හා ඒවා පරීක්ෂා කිරීම
   - බෝල් වැල්වයන්, ජල භාජන (CISTENS) ආදිය අලුත්වැඩියා කිරීම හා සරල ඇඳීම් සටහන් කියවීමට හා තේරුම් ගැනීමට හැකියාව ආදිය පිළිබඳව දැනීම තිබිය යුතුය.
3. ජලනල කර්මාන්තය පිළිබඳ වර්ෂ 02ට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය
4. වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

මාසික වැටුප: ඒකාබද්ධ වැටුප රු. 62,270.00 ( මූලික වැටුප - 32,000/- + ජීවන වියදම් දීමනාව රු.17,800 + රජයේ අනුමත දීමනා (රු. 5,000/-) සහ (EPF) 12 % (සේව්‍යයා) + සේවක භාරකාර අරමුදල් (ETF) 3 %(සේව්‍යයා) ප්‍රතිලාභ)

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**විදුලි කාර්මික ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) (Electrician -On contract)**

1. අටවන ශ්‍රේණිය සමත් විය යුතුය.
2. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණත්වයක් ලබා තිබිය යුතුය
   - විදුලි කාර්මික දෝෂයන් සොයා ගැනීම, විදුලි උපාංග, පරිනාමක (ට්‍රාන්ස්ෆෝමර්) සහ සියලුම වර්ග විදුලි උපකරණ හා යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම සහ එකලස් කිරීම, විදුලි රැහැන් සහ වයර් තෝරා ගැනීම හා ඒවා වර්ග කිරීම, මිණුම් උපකරණ හා ඒවායේ භාවිතය, විදුලි රැහැන් ඇදීමේ සහ සම්බන්ධ කිරීමේ විවිධ ක්‍රම, මනු (මීටර්) සහ කුඩා පරිණාමක පරීක්ෂා කිරීම
   - ඇඳීමේ සහ රූප සටහන් කියවීම සහ තේරුම් ගැනීම පරිමාණයන් කියවීම සහ භාගික මාන සටහන් කිරීම
   - විදුලි කර්මාන්තයේදි භාවිත වන ආයුධවල භාවිතය හා ආරක්ෂාව පිළිබඳව දැනුමක් තිබිය යුතුය.
3. රජයේ දෙපාර්තමේන්තුවක රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක විදුලි කාර්මිකයෙකු වශයෙන් වර්ෂ 02ට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය .
4. වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

මාසික වැටුප: ඒකාබද්ධ වැටුප රු. 62,270.00 ( මූලික වැටුප - 32,000/- + ජීවන වියදම් දීමනාව රු.17,800 + රජයේ අනුමත දීමනා (රු. 5,000/-) සහ (EPF) 12 % (සේව්‍යයා) + සේවක භාරකාර අරමුදල් (ETF) 3 %(සේව්‍යයා) ප්‍රතිලාභ)

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වායු සමීකරණ කාර්මික ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) (Air-Conditioning Technician - On contract Basis)**

1. අටවන ශ්‍රේණිය සමත් විය යුතුය.
2. පිළිගත් ආයතනයක් විසින් පවත්වනු ලබන වායු කාර්මීකරණ කාර්මික ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 3 මට්ටමට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් ප්‍රායෝගික පරික්ෂණය ද ඇතුළුව සාර්ථකව නිම කිරීම.
3. පහත සුදුසුකම සහිත අපේක්ෂකයන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

- ලලිත් ඇතුලත්මුදලි තාක්ෂණික ආයතනය හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පවත්වන ලබන වායු සමීකරණ පාඨමාලාව ප්‍රායෝගික පුහුණුවද සහිතව සාර්ථකව අවසන් කර තිබීම.
හෝ

- පිළිගත් තාක්ෂණික විද්‍යාලයක් මඟින් පවත්වනු ලබන මාස 06ට නොඅඩු න්‍යායාත්මක පාඨමාලා හා ප්‍රායෝගික පුහුණුවද සහිතව සාර්ථකව අවසන් කර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ (සම්පූර්ණ කාලය මාස 12කි )

4. අදාළ ක්ෂේත්‍රයේ මනා පලපුරුද්දක් තිබීම අමතර සුදුසුකමකි
5. වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

මාසික වැටුප: ඒකාබද්ධ වැටුප රු . 62,270.00 ( මූලික වැටුප - 32,000/- + ජීවන වියදම් දීමනාව රු.17,800 + රජයේ අනුමත දීමනා (රු. 5,000/-) සහ (EPF) 12 % (සේවායා) + සේවක භාරකාර අරමුදල් (ETF) 3 %(සේවායා) ප්‍රතිලාභ.)

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වඩු කාර්මික (කොන්ත්‍රාත් පදනම මත) (Carpenter - On contract)**

**අවම සුදුසුකම් :-**

1. අටවන ශ්‍රේණිය සමත් විය යුතුය.
2. පහත කාර්යයන් කිරීමේ මනා පළපුරුද්දක් තිබිය යුතුය.
   (අ) ගොඩනැගිලි හා ගෘහ භාණ්ඩ කර්මාන්තය සම්බන්ධව වඩු වැඩවලදී පාවිච්චි වන නොයෙකුත් පිරිද්දුම් සහ පිරිවැද්දුම් සකස් කිරීම.
   (ආ) නොයෙකුත් අන්දමේ වඩු ආයුධ සහ නොයෙකුත් අන්දමේ දැව වර්ග පාවිච්චිය සහ සැලසුම් කියවීම.
   (ඇ) අඟලෙන් 1/32 දක්වා පරිමාණයන් නිවැරදිව කියවීම පිළිබඳ හැකියාවන් තිබීම.

3. වඩු කර්මාන්තය පිළිබඳව වර්ෂ දෙකකට නොඅඩු පළපුරුද්දක් තිබීම
4. වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

මාසික වැටුප: ඒකාබද්ධ වැටුප රු. 62,270.00 ( මූලික වැටුප - 32,000/- + ජීවන වියදම් දීමනාව රු.17,800 + රජයේ අනුමත දීමනා (රු. 5,000/-) සහ (EPF) 12 % (සේවායා) + සේවක භාරකාර අරමුදල් (ETF) 3 %(සේවායා) ප්‍රතිලාභ.

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**පෙදරේරු (කොන්ත්‍රාත් පදනම මත) (Mason – On Contract)**

**අවම සුදුසුකම් :-**

1. අටවන ශ්‍රේණිය සමත් විය යුතුය.
2. පහත කාර්යයන් කිරීමේ මනා පළපුරුද්දක් තිබිය යුතුය.
   (අ) ගඩොල් බැම්ම, විවිධ මාදිලියේ ගඩොල් බිත්ති බැදීමේ ක්‍රම භාවිතයෙන් බිත්ති පාදම, බිත්ති ආරුක්කු කණු, විමිනි, මල අපවාහන, මනු බිල ආදිය නිර්මාණය.
   (ආ) සියලුම වර්ගවල කපරාරු සහ එහි මිශ්‍රණ, වැරගැන් වූ කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම හා ඇමීම.
   (ඇ) සැලසුම් කියවීම හා සාමාන්‍ය ඉදිකිරීම් සඳහා සැලසුමට අනුව බිම් සකස් කිරීම හා නූල් ඇදීම.
   (ඈ) තීන්ත ආලේපනය සහ ඉමල්ෂන් තීන්ත භාවිතයෙන් පින්තාරු කිරීම.
3. පෙදරේරු කර්මාන්තය පිළිබඳ වර්ෂ දෙකකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.
4. වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

මාසික වැටුප: ඒකාබද්ධ වැටුප රු. 62,270.00 ( මූලික වැටුප - 32,000/- + ජීවන වියදම් දීමනාව රු.17,800 + රජයේ අනුමත දීමනා (රු. 5,000/-) සහ **(EPF)** 12 % (සේව්‍යයා) + සේවක භාරකාර අරමුදල් **(ETF)** 3 %(සේව්‍යයා) ප්‍රතිලාභ.)

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**ක්‍රීඩාගාර සහයක (කොන්ත්‍රාත් පදනම මත) (Gymnasium Attendant – On Contract)**

**අවම සුදුසුකම් :-**

1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථයන් හයක් (06) සහිතව සමත් වී තිබීම.
2. ගෘහස්ථ ක්‍රීඩාගාරයක සියලුම උපකරණ හැසිරවීම හා නඩත්තුව පිළිබඳ දැනීම.
3. ගෘහස්ථ ක්‍රීඩාගාරයක නඩත්තුව පිළිබඳ වසර 02කට නොඅඩු පළපුරුද්දක් තිබීම.
4. ගෘහස්ථ ක්‍රීඩා පිළිබඳ දැනුමක් තිබීම. (අත් පන්දු, බැඩ්මින්ටන්, පැසිපන්දු, මේස පන්දු ආදිය).
5. වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

මාසික වැටුප: ඒකාබද්ධ වැටුප රු. 60,027.50 ( මූලික වැටුප - 30,050/- + ජීවන වියදම් දීමනාව රු.17,800 + රජයේ අනුමත දීමනා (රු. 5,000/-) සහ **(EPF)** 12 % (සේව්‍යයා) + සේවක භාරකාර අරමුදල් **(ETF)** 3 %(සේව්‍යයා) ප්‍රතිලාභ)

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**කාර්මික (කොන්ත්‍රාත් පදනම මත) (Mechanic - On Contract)**

**අවම සුදුසුකම් :-**

1. 8 වන ශ්‍රේණිය සමත්විය යුතුය.
2. පහත කාර්යයන් කිරීමේ මනා පළපුරුද්දක් තිබිය යුතුය
   i. ක්ෂුද්‍ර මිනුම් (micrometers) හා මිනුම් කියවීම හා භාගමය මානයන් (fractional dimensions) වාර්තාගත කිරීම.
   ii. වාෂ්ප, මෝටර් හා ඩීසල් යන්ත්‍රසූත්‍ර හා පිරියත පැස්සුම් පිළිබඳ හෝ ලේත්, මිලින් හා හැඩ ගැන්වීමේ (shaping) යන්ත්‍ර වැනි වැඩබිම් යන්ත්‍රසූත්‍ර (workshop machinery) ක්‍රියාකරවීම පිළිබඳ විශේෂඥ දැනුම.
   **සහ**
   iii. රූප සටහන් කියවීමේ හා වටහා ගැනීමේ හැකියාව
3. කාර්මිකයෙකු හෝ යන්ත්‍රසූත්‍ර ක්‍රියාකරුවකු ලෙස වසර දෙකකට නොඅඩු පළපුරුද්ද
4. වයස **:**අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුයි

මාසික වැටුප : මුළු වැටුප රු. 62,270.00 (මූලික වැටුප - 32,000/- + ජීවන වියදම් දීමනාව රු.17,800 + රජයේ අනුමත දීමනා (රු. 5,000/-) සහ **(EPF)** 12 % (සේව්‍යයා) + සේවක භාරකාර අරමුදල් **(ETF)** 3 %(සේව්‍යයා) ප්‍රතිලාභ.)

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**පරිපාලක (සිවිල්) (කොන්ත්‍රාත් පදනම මත) (Supervisor -On Contract)**

1. ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම හා ඒ සම්බන්ධ වර්ෂ 03ක පළපුරුද්ද ලබා තිබීම (ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය හදාරන අතරතුර ලබා ගන්නා පළපුරුද්ද ද ගණන් ගනු ලැබේ.)
   හෝ
2. අ.පො.ස.(සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 06කින් සමත් වීම හා අදාල ක්ෂේත්‍රයෙහි අධීක්ෂකවරයෙකු වශයෙන් රජයේ ආයතනයක රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක වර්ෂ 05ක පළපුරුද්දක් ලබා තිබීම

| | |
|---|---|
| මාසික වැටුප | : මුළු වැටුප රු. 63,880.00 (මූලික වැටුප - 33,400/- + ජීවන වියදම් දීමනාව රු.17,800 + රජයේ අනුමත දීමනා (රු. 5,000/-) සහ (EPF) 12 % (සේවායා) + සේවක භාරකාර අරමුදල් (ETF) 3 %(සේවායා) ප්‍රතිලාභ.) |
| බඳවා ගැනීමේ ක්‍රමය | : සම්මුඛ පරීක්ෂණයක් මඟිනි. |

පොදු කොන්දේසි :-

මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ආරම්භයේදී මාස 06ක කාලයක් සඳහා ලබා දෙන්නකි. කොන්ත්‍රාත් කාලසීමාව තුළ ඉටුකරන කාර්යයන් පිළිබඳ සෑහීමට පත්විය හැකි නම් තෝරා ගනු ලබන අයදුම්කරුගේ කාලසීමාව දීර්ඝ කිරීම පිළිබඳ සලකා බැලීමට විශ්වවිද්‍යාලයට හැකියාව තිබේ. මෙම තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද මත ප්‍රමුඛතා ලැයිස්තුගත කරන අපේක්ෂකයන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පත් "ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අනධ්‍යයන ආයතන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය, අංක 94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03" යන ලිපිනයට 2024.09.18 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඔබගේ දුරකතන අංකය හා ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයන් හා දුරකතන අංකයන් අයදුම්පතෙහි සඳහන්කර තිබිය යුතු අතර, අදාල සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සේවා කාලය තහවුරු කිරීමට අදාල සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතු අතර එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

ලේඛකාධිකාරී
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03

2024.09.02